# ශ්‍රී ලංකාවේ ආර්ථික හා සංවර්ධන ප්‍රතිපත්තීන් පිළිබඳ බලපෑම් කිරීම

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික හා සංවර්ධන ප්‍රතිපත්තීන් සමස්තයක් ලෙස වෙනස් කිරීම සඳහා දිවයින පුරා බලපෑම් කිරීමේ ක්‍රියාදාමයක් දියත් කිරීමට කාලය එළඹ ඇත. මෙම යෝජනාව ජාතික මට්ටමේ අත්දැකීම් ද, ලෝක මට්ටමේ අත්දැකීම් ද අනුව මෑත වකවානුවල සිදු වී ඇති දේ පදනම් කරගෙන සමස්ත ප්‍රතිපත්ති වෙනසක් පිළිබඳ ප්‍රසිද්ධ සංවාදයක් දියත් කරනු සඳහා ය.

## *ලෝක අත්දැකීම්*

2011 අප්‍රියෙල් 8 වැනි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානියා වන ස්ට්‍රොස් ඛාන් (Strass Khan) මහතා වොෂින්ටන් හී ශිෂ්‍යයින් අමතමින් කළ දේශනයක දී වොෂින්ටන් සම්මුතිය (Washington Consensus) මත පදනම් වූ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හෙවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ ලෝක බැංකුව (WB) හා වෙනත් අය විසින් දේශනා කළ ආර්ථික ප්‍රතිපත්ති මුළුමනින්ම වෙනස් කිරීම දැන් අවශ්‍යව ඇති බව ප්‍රකාශ කළේ ය. ඔහු මෙම ප්‍රකාශය කළේ 2008 සහ 2009 දී ඇති වූ ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය ගැන සඳහන් කරමිනි. ඔහුගේ හේතුව වූයේ මූල්‍ය ගෝලීයකරණය විසින් දුප්පතුන් හා පොහොසතුන් අතර අති විශාල විෂමතාවයක් ඇති කර තිබෙන බවත්, ඒ විසින් සමාජ සංහිඳියාව බිඳ වැටී ඇති බවත් ය. ඊට ඉඩදිය යුතු නැතැයි ඔහු කීය. '' දැන් ඔරලොසුවේ බට්ටා අනෙක් පැත්තට පැද්දී ගොස් ඇති අතර රාජ්‍යය ගැන වැඩි අවධානයක් යොමුකළ යුතු කාලය පැමිණ ඇති බවත් '' ඔහු කීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් තම සියලු සාමාජික රටවලට දුන් උපදේශය වන සියලු රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමේ යෝජනාව ගැන යළි සිතා බැලීමට සිදුව ඇතැයි ඔහු පිළිගත්තේ ය.

1997 දී නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය ඇති වූ අවස්ථාවේ එවකට ලෝක බැංකුවේ අධ්‍යක්ෂ වරයාව සිටි ජේම්ස් වුල්ෆන්සන් (James Wolfenshon) මහතා ''අනෙක් අර්බුදය'' යන තේමාව යටතේ මීට සමාන කතාවක් තම පාලක මණ්ඩලය වෙත කරමින් කියා සිටියේ ලෝක බැංකුව විසින් සමස්ත ලෝකය සඳහා ම මූල්‍ය සැලසුම් සැකසීමට උත්සහ කිරීම වැරදි බව පිළිගත යුතුය යන්නයි. සෑම රටකටම තම රටවල සිවිල් සමාජය සමග සාකච්ඡා කොට තමන්ගේම ආර්ථික හා සංවර්ධන සැලසුම් සකසා ගැනීමට ඉඩ දිය යුතු බව නැගෙනහිර ආසියානු අර්බුදයෙන් උගත යුතු පාඩම බව ඔහු පිළිගත්තේ ය. එය කළ යුත්තේ ඒ, ඒ, රටවල සුවිශේෂ පසුබිම් හා ඉතිහාසයන් තේරුම් ගනිමිනි. ලෝක මූල්‍ය ආයතනයන් විසින් කරනු ලබන වැරදි වලට වන්දි ගෙවීමට දුප්පත් ජනතාවට සිදුවී ඇති ආකාරය ඔහු විසින් පෙන්වා දෙන ලදී.

ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික උපදේශකයාව සිටි ජෝශප් ස්ටිග්ලිට්ස් (Joseph Stigligy) මහතා ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් දිරිගන්වනු ලබන ගෝලීයකරණය ප්‍රතිපත්ති විවේචනයට ලක් කලේ ය. ඔහු WB වෙන් ඉල්ලා අස් වී ගෝලීයකරණය විවේචනයට ලක්කරන ඔහුගේ සුප්‍රසිද්ධ පොත '' Globalization and Its Discontents'' ග්ලෝබලයිසේෂන් ඇන්ඩ් ඉට්ස් ඩිස්කන්ටෙන්ට්ස් හෙවත් ගෝලීයකරණය හා එහි අතෘප්තිකරණය'' ලිවීය.

දැවැන්ත ව්‍යාපාරිකයෙක් වන ජෝර්ජ් සෝරෝස් (Jeorge Soros) මහතා නැගෙනහිර ආසියාවේ ඇති වූ මූල්‍ය අර්බුදයට වගකිව යුතු ආරම්භකයා විය. ඔහු තමන්ගේ ප්‍රාග්ධන ආයෝජනයන් තායිලන්තයෙන් ඉවත් කරගැනීම නිසා බියට පත් සෙසු ආයෝජකයින් ද තම ප්‍රාග්ධන ආයෝජනයන් නැගෙනහිර ආසියාවෙන් ඉවත් කරගැනීම 1997 මෙම මූල්‍ය අර්බුදයට හේතු විය. ජෝර්ජ් සෝරෝස් මහතා විසින් ද ගෝලීයකරණය විවේචනයට ලක්කරන ලදී. මෙසේ බලන කළ ගෝලීයකරණය ලොවට දේශනා කළ ආයතන වල ප්‍රධාන නායකයින් සියල්ලන්ම පාහේ එම නව ලිබරල් ගෝලීයකරණය ප්‍රතිපත්තීන් අසාර්ථක බව පිළිගෙන ඇත.

ලෝක වෙළෙඳ සංවිධානය (WTO) ට විරුද්ධ ලොවපුරා දියත් කෙරුණු දැවැන්ත විරෝධතා ව්‍යාපාරයන් ද, ඒ තුළම පැන නැගුණු අභ්‍යන්තර ප්‍රතිවිරුද්ධතාවයන් ද විසින් WTO - ලෝක වෙළෙඳ සංවිධානය ගිවිසුම පෙර සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කරවීම වලක්වා ඇත.

ලෝකයේ පවතින ප්‍රධාන අර්බුදය වන සාගින්න සහ ඉහළ යන ආහාර මිල පිළිබඳ අර්බුදයත්, සාගින්නේ පෙළෙන ජනතාවට ආහාර සැපයීමේ නොහැකියාව (වසර 2050 දී බිලියන 9 ක් වන ලෝක ජනගහනයට ආහාර සැපයීම පිළිබඳව FAO සංවිධානය විසින් පවත්වන ලද ලෝක ආහාර සමුළුවේ පලදායක සැලැස්මක් සකස් කරගැනීමට අසමත් වීම). කියෝටෝ,බාලි හා කෝපන් හේගන් හි පැවති කාලගුණ විපර්යාස පිළිබඳ සම්මුතීන් ඇති කරගැනීමේ උත්සහයන්ගේ අසාර්ථකත්වයන් තුලින් පෙනීයන්නේ සමස්ත ලෝකයේ අනාගත පැවැත්ම ම අනතුරට ලක්ව තිබියදී පවා, ඵලදායක විසඳුම් සකසා ගැනීමට අපොහොසත්ව ඇති බවයි. 1990 දී WTO සමුළුවට එරෙහිව සියැටල් හී (SEATTLE) පැවති දැවැන්ත විරෝධතා ව්‍යාපාරයේ පටන් WTO සංවිධානය, G - 8 කණ්ඩායමේ රැස්වීම්, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන රැස්වීම් සියල්ලටම එරෙහිව අඛණ්ඩ විරෝධතා ව්‍යාපාරයන් පැන නැගුණි. සහස්‍රකයේ සංවර්ධන ඉලක්ක (Millenium Development Goals – MDGs) අසාර්ථක වී ඇත. 2015 දී ලෝකයේ සාගින්න අඩකින් අඩුකරන බවට මෙහිදී ලෝක නායකයින් පොරොන්දු වූ නමුදු ලෝකයේ සාගින්නෙන් පෙළෙන ජනතාවගේ සංඛ්‍යාව 2000 දී මිලියන 840 සිය 2009 වන විට බිලියන 1.2 දක්වා වැඩි වී ඇත. කාලගුණ විපර්යාස ව්‍යසනයන් වැඩිවෙමින් ඇති අතර විසඳුම් සඳහා උත්සහයන් අසාර්ථක වී ඇත. සමස්ත ජීවිතය හා සොබාදහමේ පැවැත්ම අනතුරට ලක්ව ඇත.
ලෝක පරිමාණයෙන් මෑත දී කරන ලද අධ්‍යයනයන් විසින් විකල්ප ප්‍රවේශයන් අවශ්‍ය බවත්, එවැනි ප්‍රවේශයන් සඳහා හැකියාව ඇති බවත් පෙන්වා දී ඇත.

2008 අප්‍රියෙල් මස එළිදක්වන ලද IAASTD – International Assessment of Agricultural knowledge Science and Technology for Development - හෙවත් ''සංවර්ධනය සඳහා කෘෂිකාර්මික දැනුම, විද්‍යාව හා තාක්ෂණය යොදවා ගැනීම පිළිබඳ ජාත්‍යන්තර තක්සේරුව'' නම් අධ්‍යයනය ලෝකයේ ඉහළම පෙළේ ආයතන ගණනාවක් විසින් නිර්දේශ කරන ලදුව, ලෝකයේ ප්‍රමුඛපෙලේ විද්‍යාඥයින් 400 ක් විසින් වසර 4 ක් පුරා ලොව රටවල් අතිවිශාල සංඛ්‍යාවක කරන ලද අධ්‍යයනයකි. ඒ අධ්‍යයනය මගින් පෙන්වා දී ඇත්තේ ලෝකයේ කෘෂිකර්මයෙහි විශාල වර්ධනයක් සිදුව ඇති නමුදු කෘෂිකර්මය බෙහෙවින් වෙනස් කළ යුතුව ඇති බවයි. ඒ වෙනස තුළින් කෘෂිකර්මයේ සමාජමය පැත්ත හා පාරිසරික පැති පිළිබඳ කර ඇති බරපතළ වැරදි හරිගැස්විය යුතු බවයි. මෙහි අවධානය කෙරෙනුයේ කෘෂිකර්මය ලෝකයේ සාගින්නේ පෙළෙන ජනතාවට ආහාර සැපයිය හැකි මාවතක් කරා වෙනස් කිරීමත්, දැනට කෘෂිකර්මය විසින් කරන පරිසර විනාශය වලක්වාලීම සඳහා විද්‍යාව, තාක්ෂණය හා දැනුම යෙදවිය යුතු බවත් ය.

ඒ අධ්‍යයනය මගින් ''ජාන වෙනස් කළ ආහාර නිපදවීමේ තාක්ෂණය හා ජීව ඉන්ධන (Bio Energy) නිපදවීමේ තාක්ෂණය විසඳුම් නොවන බව පෙන්වා දී ඇත. මෙම අවසන් වාර්තාව රටවල් 65 ක් විසින් පිළිගන්නා ලදී. එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළේ රටවල් 2 - 3 ක් පමණි.

ආහාර අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂ වාර්තාකරු වන ඔලිවියර් ඩී ෂුටර් (Olivier De Schooter) මහතා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලය වෙත 2011 මාර්තු මස ''කෘෂි පරිසර විද්‍යාව හා ආහාර අයිතිය'' (Agro-ecology and Right to Food) යන තේමාව යටතේ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවෙන් ඒ මහතා පෙන්වා දුන්නේ ලෝක ජනතාවගේ ආහාර අයිතිය සපුරාලිය හැක්කේ, එනම් වසර 2050 දී මිලියන 9000 ක් වන ලෝක ජනගහනයට ආහාර ලබාදීමේ අභියෝගයට මුහුණ දිය හැක්කේ කෘෂි පරිසර විද්‍යාව (Agro-Ecology) උපයෝගී කොටගෙන බවයි. ඔහු අප්‍රිකානු හා වෙනත් රටවල අත්දැකීම් රාශියක් උපුටා දක්වමින් කියා සිටියේ වසර 3 - 10 ක් අතර කාලයක් තුළ කෘෂි - පරිසර විද්‍යාව උපයෝගි කොට ගනිමින් ආහාර නිෂ්පාදනය දෙගුණයකින් වැඩිකර ඇති බවයි. තවද, පෞද්ගලික සමාගම් ආයෝජනය කරනුයේ තමන්ට ලාභ ඉපයීම වැඩිකරගත හැකි කටයුතු වලට පමණක් බවත්, එබැවින් ඔවුන් නිර්දේශ කරනුයේ බාහිර යෙදවුම් (රසායනික පොහොර, වාණිජ බීජ, කෘෂි රසායනික යෙදවුම්) වැඩියෙන් භාවිත කරන ක්‍රම බවත්, කෘෂි පරිසර විද්‍යාව රඳා පවතිනුයේ මෙම බාහිර යෙදවුම් මත නොව පරිසරය නිසි ලෙස යොදා ගැනීම සඳහා ශාක, ගස්කොළන්, ක්ෂුද්‍ර ජීවීන් හා සතුන් යොදාගැනීම පිළිබඳ දැනුම දියුණු කිරීම මත බවත් ය. මෙම පාරිසරික කෘෂිකර්මය විශේෂයෙන් දුෂ්කර පාරිසරික තත්ත්වයන් යටතේ වගා කරන කුඩා දිළිඳු ගොවීන්ට යොදාගත හැකිවන බවත් ය. එබැවින් අවශ්‍යවන්නේ කොතෙක් මුදල් ආයෝජනය කළ යුතුද? යන ප්‍රශ්නය නොව කෙසේද? යන ප්‍රශ්නය විසඳීම බව ඔහු පෙන්වා දුනි.

2010 මාර්තු මස බොලීවියාවේ ''කාලගුණ විපර්යාස පිළිබඳ ලෝක සමුළුවවක්'' පවත්වන ලදී. මෙය පවත්වන ලද්දේ කෝපන් හේගන් හී පැවති කාලගුණ විපර්යාස ලෝක සමුළුවේ අසාර්ථකත්වය සැලකිල්ලට ගනිමිනි ඉහත කී බොලිවියානු සමුළුවට ලෝකයේ රටවල් රාශියකින් නියෝජිතයින් 15,000 ක් පමණ සහභාගි වූහ. එහිදී '' මිහිමවගේ අයිතීන් '' (Rights of Mother Earth) නමින් ලෝක ප්‍රඥප්තියක් සම්පාදනය කරන ලදී.

බොලිවියාවේ නායකයා වන ආදිවාසී නායකයකු වූ ඊවෝ මොරාලෙස් (Evo Morales) මෙයට නායකත්වය දුනි. එම සමුළුවේ දී ලෝකය මුහුණ පා සිටින සියලු අර්බුදයන්ට හේතුකාරක වන සමස්ත ධනේශ්වර ප්‍රතිපත්තිය විවේචනයට ලක්වූ අතර එහිදී මිහිමවගේ අයිතිය ප්‍රතිස්ථාපනය කිරීමක් වශයෙන් පරිසරය යළි ප්‍රතිස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. දැන් බොලිවියානු රජය විසින් ''මිහිමවගේ නීතිය'' නමින් නව නීතියක් නීතිගත කිරීමට සූදානම්වෙමින් සිටී. ඒ මගින් සොබාදහමට එරෙහිව කෙරෙන කටයුතු දඬුවම් ලැබිය හැකි වරදවල් බවට පත් කෙරෙනු ඇත. සියලු කර්මාන්ත හා ව්‍යවසායයන් පරිසරයට කරන බලපෑම් පිළිබඳ විගණනයක් කිරීම මේ අනුව අවශ්‍යවනු ඇත.

මේ සියලු සාධකයන් විසින් ශ්‍රී ලංකාවම තුළ සමස්ත දකුණු ආසියාවේත් අප විසින් අනුගමනය කළ යුතු මාවත පිළිබඳ බැරෑරුම් ප්‍රශ්න මතු කරයි. ලෝකයේ දුප්පත් හා සාගින්නෙන් පෙළෙන විශාලම ජනතාව ජීවත් වන කලාප වල  මේ ගැන සිතාබැලීම අත්‍යාවශ්‍ය වේ.

## ශ්‍රී ලංකාවේ අත්දැකීම්

ශ්‍රී ලංකාව විසින් පසුගිය අවුරුදු 33 පුරාම අඛණ්ඩව හා ක්‍රමානුකූලව නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ මාවත අනුගමනය කර ඇත. ''වොෂින්ටන් එකඟතාවය'' මත පදනම් වූ පෞද්ගලීකරණය, නිදහස් (ලිබරල්) ආර්ථික, අපනයනය කරා යොමුවූ මාවත ඔස්සේ වේගවත් ආර්ථික වර්ධනයක් අත්පත් කොටගෙන, එය පහලට කාන්දුවීම තුළින් දුප්පත් කම අඩුකිරීමේ මාවත යන ආකෘතිය ශ්‍රී ලංකාවේ 1977 පටන් මේ දක්වා සියලු රාජ්‍යයන් විසින් අනුගමනය කරන්නට යෙදිණ.

මේ මගින් සාර්ථකත්වයක් අත්පත් කරගැනීමට ශ්‍රී ලංකාව අසමත්ව ඇති බව මෙම ආකෘතිය යෝජනා කරන හා දිරිගන්වන ලෝක බැංකුව, ජා.මූල්‍ය අරමුදල වැනි ආයතන පවා පිළිගෙන ඇත. ඒ වෙනුවට සමාජය තුළ අතිවිශාල ඇති, නැති පරතරයක් ද ජාත්‍යන්තර ණයගැති භාවයක් ද බිහිකොට ඇත. අත්‍යාවශ්‍ය දෑ වන ආහාර, කෘෂිකර්මය, සෞඛ්‍යය, අධ්‍යාපනය, විදුලිය ආදී දේ වල මිල වැඩිවීම් සිදු වී ඇත. සෙසු සියලු සේවාවන්ගේ ද මිල වැඩි වී ඇති අතර, බෙහෙවින් ප්‍රජාතන්ත්‍ර විරෝධී වූ රජයයන් බිහිකොට ඇත.

ඉහත කී සමාජ විෂමතාවයන් හේතුවෙන් පැනනැගුණු කළකිරීම් හා සමාජ ගැටුම් හේතුවෙන් තරුණ කැරලිකාරී නැගිටීම් ඇති වී තිබේ. 1971 ඇතිවූ තරුණ කැරැල්ල 10,000 කගේ පමණ ජීවිත අහිමි කළේ ය. 1988 - 90 තුළ ඇතිවූ තරුණ කැරැල්ල 60,000 ක් අතුරුදහන් වීමට හේතුවිය. උතුරේ යුද්ධය වසර 30 ක් පුරා පැවති අතර අහිමි වූ ජීවිත සංඛ්‍යාව 90,000 කට අධිකය. සමාජය තුළ අපරාධ, හිංසනයන් සහ දූෂණ බහුල ය.

ඉහත කී නව ලිබරල්වාදී (විවෘත) ආර්ථික ආකෘතිය අනුගමනය කළ ආණ්ඩු ජන අප්‍රසාදයට ලක් වූ අතර ඔවුනට තම පාලනයන් පවත්වාගෙන යාමට සිදුවූයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී පිළිවෙත් අනුවය. එසේ නැතහොත් ඔව්හු පරාජයට පත්වූහ. මෙම ප්‍රතිපත්ති වෙනස් කිරීමටත්, මීට වඩා වෙනස් ප්‍රතිපත්ති අනුගමනය කිරීමටත් පොරොන්දු වූ පක්ෂ බලයට පත්වූ බව පෙනේ.

1994 චන්ද්‍රිකා මැතිණිය බලයට පත්වූයේ පෞද්ගලීකරණයට විරුද්ධ පොරොන්දු මතය. 2005 දී මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්වූයේ මීට බෙහෙවින් වෙනස් ප්‍රතිපත්ති මාලාවක් සහිත ''මහින්ද චින්තනය'' ප්‍රකාශයට පත්කරමිනි. වී අලෙවි මණ්ඩලය යළි පිහිටු වීම, මෑත ප්‍රකාශ කළ ''අපි වවමු රට නගමු'' ගැමි දිරිය, ගම නැගුම, මග නැගුම, දිවි නැගුම ආදී ප්‍රතිපත්ති ඉහත කී අපනයන ප්‍රතිපත්තියටත්, නව ලිබරල්වාදී ප්‍රතිපත්තියටත් මුළුමනින් වෙනස් වූ ප්‍රතිපත්තීන් වේ. ඡන්ද දිනාගැනීම සඳහාත්, බලයේ සිටීම සඳහාත් මෙබඳු ප්‍රතිපත්ති ප්‍රකාශ ද ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂ සමග සම්මුතියට ඒමද අවශ්‍ය විය.

ඇතැම් අවස්ථාවලදී මිල වැඩිවීම් සීමා කිරීම සඳහා වෙළෙඳපොලට මැදිහත් වීමට රජයට සිදුවිය. සහල් මිල රු 60 ට සීමා කිරීම එවැන්නකි. අද අධික වියදම් සහිත සෞඛ්‍ය ක්‍රමය ගැන හා එහි අසාර්ථකත්වය ගැන බොහෝ මැසිවිලි ඇත. එයට හේතුව පෞද්ගලික අංශය විසින් කෙරෙන පාලනයයි. මහාචාර්ය සේනක බිබිලේ විසින් සකස් කළ සබුද්ධික ඖෂධ ප්‍රතිපත්තිය පිළිගන්නා ලෙස විශාල ඉල්ලුමක් ඇත. එය ''මහින්ද චින්තනයේ'' එක් පොරොන්දුවකි. අධ්‍යාපනය සඳහා විශාල වියදමක් දැරීමට සිදුව තිබීමත් තවත් සාධකයකි. රජයේ ප්‍රවාහන සේවය හෙවත් ලංගම යළි ප්‍රතිස්ථාපනය කරන ලෙස ඉල්ලුමක් මෙන්ම පොරොන්දුවක් ද ඇත. බාහිර, රසායනික යෙදවුම් මත කෙරෙන කෘෂිකර්මය සඳහා අතිවිශාල වියදමක් (බීජ, පොහොර හා යෙදවුම් සඳහා) දැරීමට සිදුවීමත්, සෞඛ්‍යයට එයින් වන හානි සහ පොළොවේ ස්වභාවික සාරවත් භාවය අහිමි වීම විශේෂ සැලකිල්ලක් යොමු විය යුතු පැත්තකි. අද ලෝකයේ බොහෝ රටවල රසායනික නොවන ස්වභාවික චිරස්ථායී

කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා දැවැන්ත උත්සහයන් දැකිය හැක. මෙම තිරසාර කෘෂිකර්ම ව්‍යාපාරයන් අද ලොව පුරා වර්ධනය වෙමින් ඇත.

අතිවිශාල දිරිගැන්වීම්, බදු විරාමයන්, හා වෙනත් වාසී සැලසීම්, යටිතල පහසුකම් ආදිය ලබාදී ඇතිමුත් අපේක්ෂා කළ ආයෝජකයින්ගේ පැමිණීම සිදුවී නොමැත.

ආයෝජකයින් දිරිගැන්වීම සඳහා අධිවේගී මාර්ග ඉදිකිරීම, වරායවල්, ජාත්‍යන්තර ගුවන් තොටුපලවල්, ඉඩම් හා ජලය පෞද්ගලීකරණය, ඉඩම් විකිණීම, තීරයන් විකිණීම, ඛණිජ සම්පත් ආදිය විකිණීම ආදිය යෝජිතය. ඒ මගින් පරිසර විනාශයන් තවත් උග්‍රවනු ඇත. ණය වැඩිවනු ඇත. ඒ ණය බර දැරීම සාමාන්‍ය දුප්පත් ජනතාව මත පැටවෙනු ඇත. මේ සියල්ල තිබියදී වුවද අපගේ අද ප්‍රධාන ආදායම් මාර්ගයව ඇත්තේ ලාභ, යටහත් පහත් ශ්‍රමය විකිණීමයි. ඒ මැදපෙරදිග ගෘහ සේවය හා අපනයන ඇගලුම් කර්මාන්ත ශාලාවල වැඩ කරන කාන්තාවන්ගේ ශ්‍රමයයි.

2002 දී චන්ද්‍රිකා මැතිනිය විසින් සැලසුම් කළ දිළිඳුභාවය අඩුකිරීමේ උපාය මාර්ගය (PRSP – Poverty Reduction Strategy Paper) හා රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2003 දී ඉදිරිපත් කළ ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' - (Regaining Sri Lanka) උපාය මාර්ගය යන දෙකම එකක් වූ අතර එය සකස් කරන ලද්දේ ලෝක බැංකු උපදෙස් මතය. එම උපාය මාර්ගයන් විසින් කළ යෝජනා කලින්ටත් වඩා අනතුරුදායක යෝජනාවක් විය. ඒ අතර ජලය පෞද්ගලීකරණය, නිදහස් ඉඩම් වෙළෙඳපොලක් බිහිවන පරිදි ඉඩම් හිමිකම් නීති සංශෝධනය කිරීම විය. එහි අරමුණ වුයේ ග්‍රාමීය ජනතාවට තමන් සතු කුඩා ඉඩම් විකිණීමටත්, ගොවිතැන් අතහැර නගරවලට සංක්‍රමණය වීමටත් සැලසීම විය. කම්කරු අයිතීන් හා ඔවුන් රැකියා සුරක්ෂිත තාවය ආරක්ෂා කළ කම්කරු නීති සංශෝධනය කර නිදහස් ශ්‍රම වෙළෙඳපොලක් බිහිකිරීම ද එහි ඇතුලත් විය. ඒ මගින් හාම්පුතුන්ට දැනට සංවිධාන ගතව සිටින කම්කරුවන්, ශ්‍රමිකයින් පහසුවෙන් ඉවත් කිරීමේ බලය ලබාදීමට අපේක්ෂා කෙරිණ. මේ සියල්ල අපනයනය කරා යොමුවූ වර්ධන ආකෘතිය තව දුරටත් වර්ධනය කිරීම සඳහා විය. මේ සියල්ල සමාජීය වශයෙන් බෙහෙවින් විනාශකාරී වීමට ඉඩ තිබුනි. ඒ සියල්ල යෝජනා කෙරුණේ, ඒවා යටතේ වුවද රටට තව තවත් විශාල වශයෙන් ආයෝජකයින් ගෙන්වා ගත හැකි වේද යන්න අවිනිශ්චිතව තිබිය දීය.

සමාජයීය වශයෙන්ද, ආර්ථික හා දේශපාලනමය වශයෙන් ද සලකා බලන කළ නිදහස ලැබු දින සිට 1977 දක්වා පෙර තිබු සියලු රජයයන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති, 1977 න් පසුව අනුගමනය කළ ප්‍රතිපත්ති සමග සසඳන කළ බොහෝ හිතකර තත්ත්වයන් පැවතින. මෙයින් අදහස් කරනුයේ ඒ සියලු ප්‍රතිපත්ති සියල්ල ඉතා හොඳ බවත්, ඒවා එලෙසම නැවතත් ක්‍රියාත්මක කළ හැකි බවත් නොවේ. ඒවායින් උගත හැකි පාඩම් රාශියක් තිබු බවයි. එවකට පැවති ඉතා වැදගත් ලක්ෂණයක් වුයේ එම ප්‍රතිපත්ති බෙහෙවින් සමාජ සාධාරණත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමුකොට තිබීමත් වැදගත් විය.

## *1977 පෙර තිබු ප්‍රතිපත්ති පිළිබඳ දේශපාලන පසුබිම*

ශ්‍රී ලංකාව තුළ ජනතාවට සමාජ සාධාරණත්වය පිළිබඳ අධ්‍යාපනය ලබාදෙමින් ඔවුන් සංවිධානගත කළ වාමාංශික ව්‍යාපාරයක් 1930 ගනන් වල පටන් ශ්‍රී ලංකාවේ පැවතුනි. ජනතාව සමාජ සුභසාධනය සඳහා සටන් කළේ එය තම අයිතියක් බව වටහා ගනිමිනි. ආහාර සහනාධාර ක්‍රමය ආරම්භවූයේ ජනතාව විසින් තමන්ට දැරිය හැකි මිලට ආහාර ලබාගැනීමේ අයිතියක් ඇති බව පිළිගනිමින් සටන් කළ හෙයිනි. එවකට සහල් මිල සේරුවක් (කි.ග්‍රෑ. 1ක්) ශත 25 ක් විය. සෙසු සියලු අත්‍යාවශ්‍ය ආහාර සඳහා මිල පාලනයක් විය. නිදහස් සෞඛ්‍ය සේවය, නිදහස් අධ්‍යාපනය සහ අඩු ජීවන වියදම ජනතාව විසින් ඒවා තම අයිතීන් ලෙස පිළිගනිමින් කළ සටන් වල ප්‍රතිඵල විය. වමේ ව්‍යාපාරයට කම්කරු පංතිය තුළ සැලකිය යුතු ශක්තියක් හා සහයෝගයක් තිබු අතර ඒ මගින් ප්‍රගතිශීලී කම්කරු නීති දිනාගත හැකි විය. කම්කරුවන්ගේ රැකියා සුරක්ෂිතතාවය ද එසේ දිනාගත් අයිතියකි. පැය 8 ක වැඩ දිනය හා වැටුප් අයිතීන් ද එසේ විය.

## *කුඩා ගොවීන්ගේ දේශීය කෘෂිකර්මය ආරක්ෂාකිරීමේ ප්‍රතිපත්ති*

දක්ෂිණාංශික එ.ජා.ප යට පවා කුඩා ගොවීන්ට හිත කරවුත්, වාසිදායකවුත් ප්‍රතිපත්ති සමූහයක් ක්‍රියාත්මක කරන්නට සිදුවිය. එසේ කළයුතු වූයේ ගොවි ජනතාව වමේ ව්‍යාපාරයට සහයෝගය දීමෙන් වලකාලීම සඳහාය.

වියළි කලාපය තුළ වාරිමාර්ග පහසුකම් දියුණු කර, ඉඩම් හිඟය පැවති තෙත් කලාපය හා සෙසු ප්‍රදේශවල ගොවි ජනතාවට ඉඩම් ලබා දී ඔවුන් පදිංචි කිරීමට තීරණය කළේ එම ඉඩම් හිඟ ප්‍රදේශ වල ජනතාව ක්‍රමයෙන් වමේ ව්‍යාපාරයට සම්බන්ධ වීමට නැඹුරු වූ බව වටහාගත් නිසා යැයි කියැවේ. සච්චි පොන්නම්බලම් විසින් ලියන ලද ''Dependent Economy in Crises නම් කෘතියෙහි ඔහු මේ ගැන විග්‍රහ කරයි. ජනතාවට ඉඩම් හා වාරිමාර්ග පහසුකම් හා වෙනත් බොහෝ කෘෂිකාර්මික සහාය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රතිපත්ති 1956 බණ්ඩාරනායක රජය විසින් තවත් ශක්තිමත් කරන ලදී. 1960 ගණන් වල සිරිමාවෝ රජය විසින් ද එය කරන ලදී. එබඳු රජයේ ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ ලැබූ ගොවීන්ගේ සංඛ්‍යාව මිලියන 1.2 ක් විය. සලසන ලද පහසුකම් අතර, පහසු වගා ණය ක්‍රම, රජය අලෙවිය සඳහා මැදිහත් වීම, වී අලෙවි මණ්ඩලය, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික කිරි මණ්ඩලය, ජාතික ධීවර සංස්ථාව, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමුපකාර දෙපාර්තමේන්තුව ආදිය විය. එදා එ.ජා.ප. යේ ඇතැම් අහිතකර ප්‍රතිපත්ති ද විය. වතු කම්කරු ජනතාවගේ පුරවැසි අයිතිවාසිකම් ඉවත් කිරීම එකකි. ඊට හේතුවූයේ වතුකරයේ වෘත්තීය සමිති වාමාංශික දේශපාලන පක්ෂ වලට සම්බන්ධවීමේ ප්‍රමාණතාවක් පැනනැගීම හා එ.ජා.ප. ය ඊට බිය වීම ය.

## *රාජ්‍ය මැදිහත් වීම්*

ප්‍රවාහන සේවාවන් ලබාදීම සඳහා ලංගම පිහිටුවීමට හේතුවූයේ පෞද්ගලික බස් හිමියන්ගේ බලය හා හිරිහැරයන් වලක්වාලීම සඳහා රජය මැදිහත් විය යුතුය යන්න ජනතා ඉල්ලීමක් වූ හෙයිනි. වරාය රජය පාලනය යටතට ගනු ලැබුයේ ද වරාය කම්කරුවන්ගේ වෘත්තීය සමිති ඉල්ලීම පරිදිය.

ජලය මහජන සේවාවක් ලෙස සලකනු ලැබූ අතර, එය රජයේ වියදමින් සියල්ලන්ට සපයන ලදී. එමෙන්ම වතුකරය ජනසතු කරනු ලැබුයේ වමේ ව්‍යාපාරය හා වෘත්තීය සමිති වල බලකිරීම නිසාය.

1972 සහ 1975 කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණයන් සිදුවූයේ 1971 සිදුවූ තරුණ නැගිටීමේ ප්‍රතිඵලයක් ලෙස යැයි කියැවේ. 1988 - 90 කාලය තුළ සිදුවූ දෙවැනි තරුණ නැගිටීම හේතුවෙන් ඉඩම් බෙදාහැරීම හා භාවිතය පිළිබඳ ජනාධිපති කායයීසාධක මණ්ඩලය බිහිවිය. රාජ්‍ය සංස්ථා ලෙස බොහෝ කර්මාන්ත රජය විසින් ආරම්භ කරන ලදී. මේ අතර වානේ, රෙදිපිළි, සිමෙන්ති, පිඟන් ආදි බොහෝ සංස්ථා පිහිටුවන ලදී.

මේවා බොහෝමයක් අකායයීක්ෂම වී යැයි චෝදනා කෙරෙන අතර, ඒවායින් පාඩු සිදුවී යැයි කියන නමුදු යම් සැසඳීමක් කළයුතු වන්නේ ඒවා පෞද්ගලීකරණය කිරීමේදී පෞද්ගලික අංශය වෙත ලබාදෙන ලද අතිවිශාල සහන ගැන ද සලකා බලමිනි. ඇතැම් රාජ්‍ය ආයතන හා සේවාවන් හිතාමතා දුබලකරන ලද බව ද සත්‍යයකි. මේ පිළිබඳ සෞඛ්‍ය සේවා හා අධ්‍යාපන සේවා නිදසුන්ය. මෙම රාජ්‍ය සේවාවන් බොහෝමයක් හුදෙක් ලාභ ලැබීම අරමුණු කොට ගෙනම නොව මහජනතාවට සේවාවන් සැපයීම සඳහා ද අරමුණු කෙරිණ. මෙම රාජ්‍ය ආයතනයන් පිළිබඳව වැඩි බලපෑමක් කිරීමේ ඉඩකඩ මහජනතාවට තිබුනි. මේවාට ආරම්භයේ දී රාජ්‍ය අනුග්‍රහය ලබාදීමත් අවශ්‍ය විය. ඒ සියල්ල 1977 න් පසුව ඉවත් කෙරිණ. මේ සියලු අත්දැකීම් අනුව, දැන් ශ්‍රී ලංකාව විසින් අනුගමනය කළයුතු ආර්ථික හා සමාජ සංවර්ධන මාවතේ දිශාව කුමක් විය යුතුද? යන්න සිතා බැලීම අද ඇති හදිසි අවශ්‍යතාවකි.

## *ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය යටතේ ක්‍රියාත්මක කළහැක්කේ කුමක්ද? යන්න රජය විසින් ප්‍රකාශ කොට ඇති ඇතැම් වැඩසටහන් දෙස බලන විට පෙනේ.*

මෑත වකවානුව තුළ රජය විසින් ප්‍රකාශ කොට ඇති වැඩසටහන් බොහෝමයක් දෙස බලන කළ පෙනී යන්නේ රටේ ජනතාව මුහුණදෙන ප්‍රධාන ප්‍රශ්න රාශියක් විසඳිය හැක්කේ පෞද්ගලික අංශය මත විශ්වාසය තැබීම තුළ නොවන බවයි.

පසුගිය වසර 33 ක අත්දැකීම් වලින් උගත යුතු ප්‍රධාන පාඩම එයයි. විදේශීය හා දේශීය ප්‍රාග්ධන හිමියන් විශාල වශයෙන් රට තුළ අයෝජනය වැඩිකොට, අපගේ අපනයනයන් ඉහළ නංවා ආර්ථික වර්ධන වේගය වැඩිකොට රට දියුණු කරාවිය යන බලාපොරොත්තුව අසාර්ථක වී ඇත. ඒ වෙනුවට අදඅ පට සිදු වී ඇත්තේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා අතිවිශාල වැයකිරීම් වැඩිකිරීමයි. 100% ක බදු විරාම කාලයක් ඉතා දීර්ඝ වසර ගණනාවක් සඳහා ප්‍රකාශයට පත් කර ඇත. රුපියල අව ප්‍රමාණය කිරීම නිසා අපට අතිවිශාල ආනයන වියදමක් දැරීමට සිදුව තිබේ. එසේ ආනයනය කරන භාණ්ඩ අතර ශ්‍රී ලංකාවේ පහසුවෙන් නිෂ්පාදනය කළ හැකි කෘෂිකාර්මික නිෂ්පාදන ද ඇත. රෙදිපිළි ආදී වෙනත් කර්මාන්ත ද ඇත. අපි රසායනික පොහොර ඇතුළු

සියලු කෘෂිකාර්මික යෙදවුම් ද ආනයනය කරමු. අධිවේගී මාර්ග, ගුවන් තොටුපොලවල්, වරායවල් හා තාප බලාගාර සඳහා අතිවිශාල ණය ගනිමු. අපට ඉඩම්, ශ්‍රමය, ජලජ සම්පත් හා වෙනත් ස්වභාවික සම්පත් අඩුමිලට විකිණීමට සිදුව ඇත.

‘‘යළි පුබුදමු ශ්‍රී ලංකා’’ උපාය මාර්ගික පැකේජයට ඇතුලත්වූ කරුණු අතර ග්‍රාමීය කෘෂිකාර්මික ජනගහනය ඉඩම් වලින් පිටමං කොට නගර වලට සංක්‍රමණය වීමට සැලැස්වීම, ඔවුන් එසේ පැමිණෙන්නේ ඉඩම් අහිමි අනාථයින් ලෙස වීම, නගර වලින් දුප්පත් ජනතාව පිටමං කොට නාගරික සංවර්ධනය දියුණු කිරීම හා එසේ සුඛෝපභෝගී නවීකරණය කළ නගර බිහිකොට ව්‍යාපාරිකයින් ආකර්ශනය කිරීම, කුඩා පරිමාණයේ ධීවරයින් වෙරළ තීරයෙන් පිටමං කොට සංචාරක ව්‍යාපාර සඳහා වෙරළ ඉඩ ලබාදීම, මහ පරිමාණ කාර්මික ධීවර කර්මාන්ත සඳහා ආයෝජකයින්ට මුහුද හා වෙරළ ඉඩ ලබාදීම. මුහුදු ගුවන් යානා බැස්සවීම සඳහා කළපු හා ජලාශ ඉඩකඩ ලබාගැනීමෙන් ඒවායින් ජීවත්වන ධීවරයින් අනාථ කිරීමට සංවිධානය වූ ශ්‍රමිකයින් රැකියාවලින් පිටමං කිරීම පහසු කරවන කම්කරු නීති සංශෝධනය ඇතුලත් විය.

මීට අමතරව යුද්ධයෙන් අවතැන් වූ ජනතාව ඔවුන්ගේ ගම්බිම්වල යළිපදිංචි කරවීම ප්‍රමාද කරමින්, ඒ උතුරු - නැගෙනහිර ඉඩම් සඳහා විදේශ හා දේශීය අයෝජකයින් ගෙන්වීම බලාපොරොත්තු වේ. වතු කම්කරු ජනතාව ඉතා අඩු වැටුපකට හා ඉතා පහත් ජීවන තත්ත්වයකට හිරකොට තබාගනිමින් රටේ ගෞරවනීය පුරවැසියන් බවට පත්වීමට ඔවුනට ඇති අයිතිය අහෝසි කිරීමද සිදුවේ. වතු සමාගම් වලට තම ලාභ විශාල කරගැනීම සඳහා වතුකරයේ භූමිය විනාශකාරී ලෙස සූරාගැනීමේ ඉඩකඩ ලබාදී ඇත. ලාභ යටහත් ශ්‍රමිකයින් ලෙස සංක්‍රමණීය කම්කරු ස්ත්‍රීන් යොදවා ගැනීමටත්, ඇඟලුම් කර්මාන්තශාලාවල ස්ත්‍රීන් වහල් සේවයේ යෙදවීමත් සිදුවේ. එය අප රටේ ප්‍රධාන ආදායම් මාර්ගව වී ඇත. මේ සියල්ල එකට ගත්විට අපනයනය කරා යොමුවූ ආර්ථික වර්ධන මාවතේ තවදුරටත් ඉදිරියට යාම සඳහා රටේ සියලු ජනතාව තම ඉඩකඩම් හා ස්වභාවික සම්පත් වලින් පිටමං කොට, ජීවන මාර්ග අහිමිකොට අනාථ කිරීම අපේක්ෂා කෙරේ.

තවද, ජලය පෞද්ගලීකරණය හා වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කිරීම, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ආනයනයන් වැඩිකිරීම රටේ සියලු දුප්පත් ජනතාවට ජීවිතය දැරිය නොහැකි බරක් බවට පත් කෙරෙනු ඇත. මේ අනුව අපි අවසානය වන්නේ, දුප්පත් ජනතාවගේ දුප්පත්කම අඩුකිරීමේ නාමයෙන් ඔවුන්ගේ දුප්පත්කම තවත් වැඩිකිරීමේ පුදුමාකාර අතාර්කික තත්ත්වයකය. මෙවැනි ක්‍රියාදාමයන් දියත් කිරීම කළ හැකිවන්නේ අතිවිශාල වර්ධනයක් ඔස්සේ පමණි. මේ අනුව රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවීම සඳහා මහින්ද රාජපක්ෂ හා ඔහුගේ පවුලේ අය බලයෙන් පහකොට වෙනත් කාට හෝ බලය පැවරීම ප්‍රමාණවත් නොවේ. මෙම ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳ දර්ශනයට බෙහෙවින් ඒකාධිපති පාලනයක් අවශ්‍ය වේ. මෙය මුළුමනින්ම වෙනස් කළ යුත්තකි. මේ අනුව ‘‘ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංවාදයට නිසි වටිනාකමක් දිය යුතුය. අපි දැන් පැමිණ සිටින තත්ත්වය අනුව ජනතාවගේ සමස්ත විභවය, හැකියාව, උපයෝගි කොටගැනීම ඔවුන්ගේ දිළිඳු භාවය තුරන් කරනු සඳහා, සාගින්න දුරුකිරීම හා ජීවනමාර්ග සපුරාගැනීම සඳහා අවශ්‍ය වේ.

මෙය කළ යුත්තේ, අප සතුව තිබෙන සොබාදහමේ ශක්තිය හා පාරිසරික වාසිදායක තත්ත්වයන් උපයෝගී කොට ගනිමිනි. එය කළ යුත්තේ සොබාදහමේ සම්පත් ක්ෂයවන ආකාරය නොව, සොබාදහම ප්‍රතිඋත්පාදනය කර ගැනීමටඇති හැකියාව වැඩි දියුණු කරගනිමිනි. රජය විසින් ප්‍රකාශයට පත්කොට ඇති විවිධ වැඩසටහන් තුළ, එනම් සමෘද්ධි ව්‍යාපාරය, අපි වවමු, රට නගමු, ගමනැගුම, ගැමිදිරිය, දිවිනැගුම වැනි වැඩසටහන් තුළ මේ හැකියාව ඇත. මෙම වැඩසටහන් ඡන්ද දිනාගැනීම සඳහා පාවිච්චි කරනු හිස වචනවල තත්ත්වයේ සිට යථාර්ථයන් බවට ඔසවා තැබිය යුතුය. මේ සියලු වැඩසටහන් වල දර්ශනය වන්නේ ජනතාව විසින් තමන්ගේම ප්‍රජා සැළසුම් සකස් කිරීම සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය හා සහභාගිත්වය ඇතිව කළයුතු බවයි. ඒවායේ දී ස්ත්‍රී, පුරුෂ සහභාගිත්වය ඇතිව කළයුතු බවයි. ඒවායේ දී ස්ත්‍රී, පුරුෂ සමභාගිත්වය අවශ්‍යය.

## ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ දැක්ම

මෙම සංවර්ධන විවාදය පිළිබඳව ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ දෘෂ්ඨියෙන් බලන කළ, පාරිසරික කෘෂිකර්මය පිළිබඳ වත්මන් යෝජනා සොබාදහම සමග වඩා හොඳ සංහිඳියාවක් හා සහයෝගීතාවයකින් යුතු බවත්, ඒ අනුව ඒය ස්ත්‍රීවාදී දෘෂ්ඨියකින් යුතු බවත් පැහැදිලි වේ. එහිදී ජීවිතය පවත්වා ගැනීම කෙරෙහි, සොබාදහම ප්‍රචණ්ඩ ලෙස සූරාකෑමට වඩා වැඩි අවධානයක් යොමුකරයි. එය මිනිසුන් සූරාකෑම වෙනුවට සහයෝගීතාවය කෙරෙහි නැඹුරු වී ඇත. ආහාර, පෝෂණය සහ නිරෝගීභාවය වැනි ආසන්න අවශ්‍යතා කෙරෙහි වැඩි යොමුවක් ඇත. එය තෘෂ්ණාව හා ප්‍රචණ්ඩ ලෙස උදුරාගැනීම අවධාරණය නොකරයි. සංරක්ෂණය, තිරසාරභාවය, සංහිඳියාව හා රැකවරණය ගැන ජීවිතය පිළිබඳ වැඩි අවධානයකින් යුතුය.

භාවිතාවේ දී අත්දැකීම් අනුව ද ස්ත්‍රීහු කුඩා පරිමාණ පාරිසරික කෘෂිකර්මය කෙරෙහි, මහ පරිමාණ වාණිජ කෘෂිකර්මයට වඩා මුල්තැනක් දෙති. ගොවිතැනේ දී ස්ත්‍රීන් විසින් ඉටුකරන කාර්‍යභාරය ගැන දැනට වඩා විශාල අවධානයක් යොමු විය යුතුය. සොබාදහම රැකබලාගන්නා භාරකරුවන් ලෙස ස්ත්‍රීන්ට වඩා හොඳ කාර්‍යභාරයක් ඉටුකළ හැක. සොබාදහමේ ප්‍රතිඋත්පාදනය යළිගොඩනැගීම සඳහා ඔවුනට වඩා ප්‍රයෝජනවත් කාර්‍යභාරයක් ඉටුකළ හැකිව ඇත. මේ පිළිබඳව ස්ත්‍රීන්ට වැඩි අත්දැකීමක්ද ඇත. මෙම ගොවිතැන සැලසුම් කිරීමේ දී ස්ත්‍රීන්ට වඩා විශාල කාර්‍යභාරයක් ඉටුකළ හැකිව තිබේ.

දිළිඳුභාවය තුරන් කිරීම සඳහා මිනිසා සහ සොබාදහම සතු විභවය උපයෝගී කොටගැනීම සඳහාත් මුළුමනින්ම වෙනස් කළ උපාය මාර්ගයක් අවශ්‍යය.

මේ සියලු වැඩසටහන් වලදී ශ්‍රී ලංකාව තුළත් සෙසු බොහෝ සංවර්ධනය වන රටවලත් ඉහළම ප්‍රමුඛතාවය හිමිවිය යුත්තේ දිළිඳුභාවය තුරන් කිරීම පිළිබඳවය. ණයට ලබාගත් ප්‍රාග්ධනය මත දිළිඳුභාවය තුරන් කිරීමට දැරූ උත්සහයන් අසාර්ථක වී ඇත. ඊට හේතුව ප්‍රාග්ධනය ණයට දෙන්නන් ඔවුන්ගේ ණය උපයෝගී කොටගන්නේ ලාභ ඉපයීම හා රැස්කිරීම වැඩිකරනු සඳහා මිස දිළිඳුභාවය තුරන්කරනු සඳහා නොවීමයි.

මේ අනුව, ඵලදායක ලෙස දිළිඳුභාවය අඩුකිරීම සඳහා උනන්දු වන ඕනෑම රටක්, හැකි තරම් දුරට බාහිර ප්‍රාග්ධනය මත රඳා නොපවතින ක්‍රම සොයාගත යුතුව ඇත. මෙය කළ හැකිවන්නේ සොබාදහමේ සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමෙනි. මෙය චිරස්ථායි වීමට නම් මෙසේ සොබාදහමේ සම්පත් උපයෝගි කොටගැනීම කළයුත්තේ ඉහත කී සම්පත් ක්ෂය නොවන ආකාරයෙනි. ඇත්ත වශයෙන්ම, අද අවශ්‍යතාවය වන්නේ සොබාදහමට තම ප්‍රතිඋත්පාදන හැකියාව යළිගොඩනගා ගත හැකිවන ආකාරයට එය කළ යුතුය.

කෝටි ගණනක් වූ සාමාන්‍ය ජනතාව විසින් තමන්ගේ අත්‍යාවශ්‍ය උවමනාවන් වන ආහාර, ජලය, සෞඛ්‍යය සහ නිවාස ආදිය සපුරාගැනීමේ වගකීම තමන් අතටම පවරාගනිමින්, සොබාදහම සමග කටයුතු කිරීමේ දී එහි සම්පත් යළි ප්‍රතිඋත්පාදනය වන ආකාරයට ක්‍රියාකිරීම එනම් පසේ සාරවත්භාවය වැඩි දියුණු කිරීම හා $CO_2$ වායුව උරාගැනීම වැඩිකිරීම සඳහා හැකිතරම් ගස් සිටුවීම, පළිබෝධකයින්ගේ ස්වභාවික පාලනය වැඩි දියුණු කිරීම, කාබනික ද්‍රව්‍ය ගස්වලට උරාගත හැකි ආකාරයට වර්ධනය කිරීම සඳහා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම, කෘෂි වනවගාවන් මගින් වන ආවරණය වැඩිකිරීම, පස සෝදා පාළුවීම වැලැක්වීම සඳහා වැටියෙදීම හා පස් ආස්තරණ යෙදීම හා වැටවල් ඉදිකිරීම, සියලු කාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය මේ සඳහා ගස්වල කොළ අතු හා සත්ත්ව අපද්‍රව්‍ය යොදාගැනීම, ගොම හා ගව මුත්‍රා යොදාගැනීම, පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩිකිරීම (හියුමස් පස් තට්ටුව දියුණු කිරීමෙන්) ස්වභාවික බීජ සංරක්ෂණය හා භාවිතය, දෙමුහුන් බීජ හා ජාන වෙනස් කළ බීජ වෙනුවට යොදාගැනීම ආදිය ජනතාව විසින්ම භාරගෙන කළ හැකි ක්‍රියාකාරකම් වේ. මෙහිදී ණයට ගන්නා බාහිර ප්‍රාග්ධනය සඳහා ඇත්තේ අඩු අවශ්‍යතාවයකි.

චිරස්ථායි ගොවිතැන පිළිබඳව ලොවපුරා ව්‍යාපාරයන් බිහිවීම හා ඒවායේ අතිවිශාල වර්ධනය අවධානයට ගතයුතු කරුණකි. වියා කම්පසීනා (Via Campasena) සහ IFOAM වැනි කාබනික ගොවි ව්‍යාපාරයන් විසින් කෘෂිකර්මය තිරසාර ක්‍රම කරා පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කොට ඇත.

ශ්‍රී ලංකාවේ රජයට කුඩා ගොවීන් උපයෝගී කොට ගනිමින් ඔවුන්ගේ ආහාර මිල ප්‍රශ්නය, පෝෂණය දියුණු කිරීම, ආහාර ආනයනය කිරීම සඳහා දැරීමට සිදුව ඇති අතිවිශාල වියදම් හා රසායනික පොහොර හා වෙනත් රසායනික යෙදවුම් සඳහා අධික වියදම් දැරීමට සිදුවී තිබීම යන ප්‍රශ්න වලට මුහුණදීමට ගෙන ඇති තීරණය යනු අප විසින් සංවර්ධනය හා දිළිඳුභාවය දුරු කිරීම සඳහා ගතයුතු දිශාව ගැන යළි සිතා බැලීමට මහඟු අවස්ථාවකි. මෙම රජයේ වැඩසටහන් විසින් නිවැරදිව දැක ඇති ආකාරයට ලංකාවේ දශලක්ෂ ගණන් කුඩා ගොවීන්ගේ විභවයන්, ඔවුන් විසින් සොබාදහමේ නොමිලයේ දෙන දායාදයන් නිසි භාවිතයට ගැනීමේ ඇති විශාල ඉඩකඩ ගැන සිතා බැලිය යුතුය.

## *දශලක්ෂ ගණන් ගොවීන් ගොවිතැන් නිවැරදිව කරන තත්ත්වයට මෙහෙය විය හැක්කේ කෙසේ ද?*

ගොවීන් තම ගොවිතැන් කරන ආකාරය වෙනස් කරනුයේ එය ඔවුනට වඩා වාසිදායක බව පෙනුනහොත් පමණි. දැනට බහුතරයක් ගොවීන් තුළ ඇති වැටහීම වන්නේ බාහිර යෙදවුම් සහිත ගොවිතැන වඩා හොඳ ගොවිතැන් ක්‍රමය බවයි. මෙම විශ්වාසයට විශාල වශයෙන් හේතු වී ඇත්තේ ඔවුන් දන්නා එකම ගොවිතැන් ක්‍රමය එය

වීමයි. එබැවින් වඩා නිවැරදි ගොවිතැන් ක්‍රමය කුමක්ද? යන්න පිළිබඳව ගොවීන්ට යළි අධ්‍යාපනය ලබාදීමේ මාර්ග සකසා ගත යුතුව ඇත. පාරිසරික ගොවිතැන වඩා විද්‍යාත්මක බව පෙන්වා දීම පමණක් නොව එය වඩා වාසිදායක බවද වටහා දිය යුතුය. එය දිගුකාලීනව පමණක් නොව කෙටිකාලීනවද වාසිදායක බව පෙනිය යුතුය. බාහිර යෙදවුම් වලක්වා ගැනීමෙන් හා සිදුවන අතිවිශාල ඉතිරිය හා එලදා වර්ධනය පෙන්වා දිය යුතුය. එක්, එක් ගොවියාට පුද්ගලිකව ලැබිය හැකි වාසියට අමතරව සියල්ලන්ට පොදුවේ ලාබෙන වාසිදායක තත්ත්වයන් පැහැදිලි කළ යුතුය. සොබාදහමට ඉන්වන එකතුව පෙන්විය යුතුය. සියලු ජීවීන්ගේ පැවැත්ම රැකගැනීම සඳහා කෘෂිකර්මය පරිවර්තනය කිරීම අවශ්‍යය. අපි සොබාදහම සමග කටයුතු කරන ආකාරය වෙනස් කිරීම අවශ්‍ය ය. පාරිසරික කෘෂිකර්මය හා සමග බැඳුණු වටිනාකම් පද්ධතිය අතිවිශාල ලාභ උකහාගැනීම සමග බැඳුණු වටිනාකම් වලට වඩා වෙනස් වූවකි. සම්පත් බෙදාහදාගැනීම, සහයෝගීතාවය හා සාමුහිකකරණය එහි වටිනාකම් වේ. වැඩි ප්‍රමුඛතාවයක් ඒවාට හිමිවේ.

ලෝකය අද මුහුණපා සිටින අර්බුදයන් වන සාගින්න, වන විනාශය, පාරිසරික විපර්යාස, ලෝක පරිමාණයේ මූල්‍ය අර්බුද, ලෝක වෙළෙඳ අර්බුද ගැන වඩා ගැඹුරු වූත්, පුළුල් වූත් අවබෝධයක් ඇති වීම පාරිසරික කෘෂිකර්මයේ අවශ්‍යතාවය වටහා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වේ. මේ සියල්ල නිවැරදි දේශපාලන දර්ශනයක් මත ගොඩනැගෙන ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය වේ.

මෙබඳු අංග සම්පූර්ණ, පුළුල් දර්ශනයන් හා ඉදිරි දැක්මක් පාරිසරික කෘෂිකර්මය පිළිබඳව සම්පාදනය කිරීම ප්‍රයෝජනවත් ආරම්භක පියවරකි. මෙය කළයුත්තේ දැනට මෙය භාවිතා කරන අය එකතු වීමෙනි. දැනටමත් මෙය බොහෝ භාවිතා කරන්නන් හා විද්‍යාඥයින් විසින් කරමින් සිටිති. ඊළඟ පියවර විය යුත්තේ දශලක්ෂ ගණන් වූ ගොවීන් විසින් මෙය වටහා ගැනීමට හා පිළිගැනීමට සැලැස්වීමයි. ඒ ක්‍රමවේදයන් පිළිගැනීමට සැලැස්වීමේ උපාය මාර්ගයක් සැලසුම් කළ යුතුය.

දැනට ලොව පුරා දශ ලක්ෂ ගණන් කුඩා ගොවීන්ට, දැන් කරන ගොවිතැනේ වියදම් අධික වීම නිසා ගොවිතැන් කළ නොහැකි තත්ත්වයක් උග්‍ර වී තිබීමත්, දැනට ඇති සම්මත කෘෂිකර්මය ප්‍රාග්ධනය අහිමි ගොවීන්ට අතහැර දැමීමට සිදුවීමත්, ලෝකයේ වැඩිවෙමින් පවතින සාගින්න විසඳීමට වත්මන් කෘෂිකර්ම රටාවට නොහැකිව තිබීමත් දෙස බලන කළ මෙම බාහිර යෙදවුම් අවශ්‍ය නොවන ගොවිතැන, එම ජනතාව අතර ප්‍රචලිත කළ හැකි දෙයක් බව පෙනේ. කුඩා ගොවීන් දැනටමත් මෙම පාරිසරික ගොවිතැන උකහා ගනිමින් සිටින බවට සාක්ෂි එමට ඇත. ශ්‍රී ලංකාව තුළ ද මෙය විදහා දැක්විය හැකි නිදසුන් රාශියක් ඇත. මෙම පරිවර්තනයේ දී ස්ත්‍රීන්ට හා ස්ත්‍රී සංවිධාන වලට විශාල වැඩ කොටසක් කළහැකිව තිබේ. ඔවුනට එහි නායකත්වය ගත හැකිව ඇත.

රටේ සියලුම ප්‍රදේශවල පාහේ ග්‍රාමීය ජනතාව අතර පාරිසරික ගොවිතැන ප්‍රචලිත කිරීමෙහි නිරතව සිටින සංවිධාන විශාල සංඛ්‍යාවක් ඇත. ඔවුහු විවිධ ආකාරයෙන් එය කරති. එම සංවිධාන එක්සත්ව තම ප්‍රයත්නයන් ඒකාබද්ධ කළ යුතුය.දැනට මේ ගැන දැනුමක් හා පළපුරුද්දක් ඇති ගොවීන්, ගොවි කාන්තාවන් ඒ ගැන සෙසු ගොවීන් පුහුණු කිරීම ඔවුන්ගේ වගකීමකි.

ඒ සඳහා ඔවුනට ඉඩ ප්‍රස්ථා සලසා දිය යුතුය. ඔවුන් ගේ උත්සහයන්ට සුදුසු ප්‍රතිලාභයක් ලබාදීම සුදුසු ය. මෙහි ආදායම් හා වියදම් ගණන් බැලීමේ දී, පාරිසරික ගොවිතැන විසින් අවශ්‍ය ආයෝජනයන්ගේ විශාල ඉතිරියක් කරන බව පෙනේ. එබැවින් එම ගොවිතැනින් වාසි ලබාගන්නා ගොවීන්ට, එම පුහුණුව සඳහා යම් කිසි ගෙවීමක් කිරීම කළහැක්කකි. එසේ පුහුණු කරන ගොවීන්ට එය ලබාදිය යුතුය.

ගොවීන් පාරිසරික ගොවිතැන සඳහා පුහුණු කිරීම අළුත් වෘත්තියක් ලෙෂ ගොඩනැගිය හැක්කකි. එය තරුණයින්ට කළහැකි ආකර්ශනීය වෘත්තීයකි. ඒ ගොවිතැනින් අතිරේක ආදායම් ඉපයිය හැකිවන නිසාත්, වෙනත් ප්‍රතිලාභ රාශියක් ඇති නිසාත්, මේ ඉතිරිකිරීම් වලින් තරුණ පුහුණුකරුවන්ට යම් සැලකිය යුතු දීමනාවක් ලබාදිය හැකිව තිබේ.

ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධාන බාධාවක් වන්නේ තවමත් ප්‍රධාන ප්‍රවාහයේ කෘෂිකර්මය මේ පරිවර්තනය භාරගෙන නොතිබීමයි. තම ප්‍රවේශය වෙනස් කිරීමට රටේ ප්‍රතිපත්ති සම්පාදකයින් තවමත් අධිෂ්ඨාන කොටගෙන නොමැත. රටේ ප්‍රධාන ප්‍රතිපත්තිවලට බලපෑම ගොවි ව්‍යාපාරයන් මගින් සිදුවිය යුතු අතර එය සිදුවිය යුත්තේ කෘෂි ජාවාරම්කාර සමාගම් අතින් නොවේ. සෞඛ්‍ය සම්පන්න, වසවිසෙන් තොර, පෝෂ්‍යදායක ආහාර දැරිය හැකි මිලට ලබාගැනීමට පාරිභෝගිකයින් සතු අයිතිය ගොවීන්ට වඩා හොඳ ගොවිතැන් ක්‍රමයක් අනුගමනය කිරීමට ඇති අයිතිය සමග සම්බන්ධ කළ යුතුය. වසවිසෙන් තොර ජලය හා පාරිසරයක් ලබාගැනීමට ඇති අයිතිය මෙම අරගලය සමග සම්බන්ධ කළයුතු තවත් පැත්තකි. කෘෂිකර්මයේ අධ්‍යාපනය,

ප්‍රචාරය හා ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි කෘෂි ජාවාරම්කාර සමාගම් වලට ඇති බලපෑම විශාල බාධකයකි. මෙයට එරෙහිව විශාල බලපෑමක් කළ යුතුව ඇත.

රටේ ඉඩම් නීති විසින් ජනතාවට ඉඩම් හා වෙනත් ස්වභාවික සම්පත් භුක්තිවිඳීමට ඇති අයිතිය හා අවශ්‍යතාවය ගැන විශාල සැලකිල්ලක් දැක්විය යුතුය. ඉඩම් අයිතිය නොමැති ජනතාව හා කුඩා ඉඩම් කැබලි වගා කරන ජනතාව විසින් ඉඩම් පිළිබඳවත් සෙසු ස්වභාවික සම්පත් පිළිබඳවත් තමන්ගේ පාලනයක් ඇති කරගැනීමේ ඉල්ලීම ශක්තිමත් කළ යුතුය. එය කළයුත්තේ සොබාදහමේ සම්පත් වල ප්‍රතිඋත්පාදන හැකියාව යළි ගොඩනැගීම සඳහා තමන්ගේ සැලසුම් ද ඉදිරිපත් කරමිනි. ස්ත්‍රීන්ට ඉඩම් හා ස්වභාවික සම්පත් පාලනය කිරීමට ඇති අයිතිය ගැන ඉහළ ප්‍රමුඛතාවයක් දිය යුතුය.

රටේ කවර ප්‍රදේශයක ජීවත් වන ජනතාවට වුවද, ඒ, ඒ, ප්‍රදේශවල භූමිය පාලනය කිරීම, සැලසුම් කිරීම හා එහි ප්‍රතිඋත්පාදන හැකියාව ගොඩනැගීම තුළින් එලදාව වැඩිකරගැනීමට ඇති අයිතිය තිබිය යුතුය. මෙය රට පුරා ගොවි ජනතාවට මෙන්ම, වතුකරයේ වතු කම්කරු ජනතාවටද, ධීවර ජනතාවටද, උතුරු නැගෙනහිර ජනතාවටද ලැබිය යුතු අයිතියකි.

වත්මන් වෙළෙඳ ක්‍රමයේ ඇති වැරදි නිවැරදි කිරීම සඳහා නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින් අතර හුවමාරු ක්‍රම වර්ධනය කළ යුතුය. එය ලාභ ඉපයීම අරමුණු කොටගත් වෙළෙඳාමට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුත්තකි. රටේ වෙළෙඳ නීති විසින් නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින් ද ආරක්ෂා කළ යුතුය. මෙවැනි මැදිහත්වීම් ලංකාවේ පැවත තිබේ. එය රජය විසින්ද, සමුපකාර සමිති විසින්ද කරන ලද්දකි. ඒවා සමහරක් යළි ප්‍රතිස්ථාපනය කළ හැකිව තිබේ.

මෙම සංවාදය පුළුල් ලෙස ජනතාව අතර ගෙනයාම සඳහා සංවිධාන යාන්ත්‍රණයන් ගොඩනැගිය යුතුය. මෙබඳු සංවිධාන යාන්ත්‍රණයක් ගොඩනැගීමේ ආරම්භක පියවර විය හැක්කේ දැනටමත් මෙම ප්‍රතිපත්ති පිළිගන්නා සංවිධාන අතර ආරම්භක සාකච්ඡාවක් කැඳවීමයි. මෙබඳු ආරම්භකයින් කණ්ඩායමකට ලාභ නොලබන සිවිල් සමාජ සංවිධාන පාරිසරික කෘෂිකර්ම ව්‍යාපාර, විද්‍යාඥයින්ථ ආර්ථික විද්‍යාඥයින්, දේශපාලනඥයින් වැනි වෙනසක අවශ්‍යතාවය වටහාගෙන ඇති පිරිස් ද, බුද්ධිමතුන්, ආගමික හා සදාචාරාත්මක නායකයින් ආදී අප දේශනා කරන දේ හා ක්‍රියාත්මක කරන දේ අතර ඇති බරපතළ පරස්පරතාවය ගැන සැළකිලිමත් වන අය ද ඇතුලත් විය.

කෘෂිකර්මය ආහාර හා පරිසරය සම්බන්ධ ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ පැති මානයන් හැඩගැස්වීමේ පියවරක් ලෙස ස්ත්‍රී සංවිධාන වලට මෙම ක්‍රියාකාර්ත්වයට මුලපිරිය හැකිය.

**සරත් ප්‍රනාන්දු**
**මෙහෙයුම්කරු**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**